# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2313/07 - 2023 ජනවාරි මස 02 වැනි සඳුදා - 2023.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී./11/1980(36)

**1980 අංක 26 දරන ආහාර පනත**

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කෙහෙළිය රඹුක්වැල්ල,**
සෞඛ්‍ය අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 2022 ආහාර (පිරිපහදු කරන ලද තිරිඟු පිටිවල ගුණාත්මක බව වැඩි කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2024 ජනවාරි මස 01 වැනි දින සිට එම නියෝග බලාත්මක විය යුතු ය.

2. මේ නියෝගවල කාර්යය සඳහා, තිරිඟු පිටි යන්නෙන් පිරිසිදු කරන ලද ධාන්‍ය ට්‍රිටිකම් එයිස්ටිවම් එල්. හෝ ට්‍රිටිකම් කම්පැක්ටම් හොස්ට් (*Triticum aesitivum* L. or *Triticum compactum* Host) ඇඹරීම සහ හැලීම මගින් ලබාගන්නා පිරිසිදු උසස් තත්ත්වයේ නිෂ්පාදනය අදහස් වන අතර එයට පූර්ණ තිරිඟු පිටි හා පිරිපහදු කරන ලද තිරිඟු පිටි ඇතුළත් වන අතර පිරිපහදු කරන ලද තිරිඟු පිටි පූර්ණ තිරිඟු පිටිවලින් නිස්සාරණය කරගනු ලබන තිරිඟු පිටි විය යුතු ය.

3. දේශීය පරිභෝජනය වෙනුවෙන් සිල්ලර අලෙවිය සඳහා හෝ පාන් නිෂ්පාදනය කිරීම සඳහා පිරිපහදු කරන ලද තිරිඟු පිටි නිෂ්පාදනය කරනු ලබන යම් තැනැත්තකු විසින්, එම පිරිපහදු කරන ලද තිරිඟු පිටි ෆෝලික් අම්ලය සහ යකඩ එක් කිරීමෙන් එහි ගුණාත්මකභාවය වැඩි කරනු ලැබිය යුතු අතර එම ගුණාත්මකභාවය වැඩි කරන ලද පිරිපහදු කළ තිරිඟු පිටිවල පහත සඳහන් ද්‍රව්‍ය අඩංගු වන බවට තහවුරු කළ යුතු ය ;

(අ) 2-3 මිලි ග්‍රෑම්/කිලෝ ග්‍රෑම් අතර වූ පරාසයක ෆෝලික් අම්ලය ; සහ

(ආ) මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි, සෝඩියම් අයන් එතිලීන්ඩයිඇමීන්ටෙට්රාඇසිටේට් (NaFeEDTA) හෝ ෆෙරස් ෆියුමරේට් (Ferrous fumarate) හෝ ෆෙරස් සල්ෆේට් (Ferrous sulphate) වශයෙන් වූ යකඩ.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. දේශීය පරිභෝජනය වෙනුවෙන් සිල්ලර අලෙවිය සඳහා හෝ පාන් නිෂ්පාදනය කිරීම සඳහා පිරිපහදු කරන ලද තිරිඟු පිටි නිෂ්පාදනය කරනු ලබන යම් තැනැත්තකු විසින්, එම පිරිපහදු කරන ලද තිරිඟු පිටිවල සියයට අසූවකට (80%) වඩා අඩු නොවන නිස්සාරණ අනුපාතිකයක් පවතින බවට තහවුරු කළ යුතු ය.

5. පාන් නිෂ්පාදනය හැර වෙනත් ඕනෑම ව්‍යාපාරයක් වෙනුවෙන් සැපයීමේ කාර්යය සඳහා පිරිපහදු කරන ලද තිරිඟු පිටි නිෂ්පාදනය කරනු ලබන යම් ව්‍යාපාර කටයුත්තක යෙදී සිටින යම් තැනැත්තකු විසින් එම පිරිපහදු කරන ලද තිරිඟු පිටිවල සියයට හැත්තෑ හතරකට (74%) වඩා අඩු නොවන නිස්සාරණ අනුපාතිකයක් පවතින බවට තහවුරු කළ යුතු ය.

**උපලේඛනය**

| *යකඩ වර්ගය* | *මට්ටම* |
|---|---|
| සෝඩියම් අයන් එතිලීන්ඩයිඇමීන්ටෙට්රාඇසිටේට් (Sodium iron ethylenediaminetetraacetate) (NaFeEDTA) | 35 - 40 මිලි ග්‍රෑම්/කිලෝ ග්‍රෑම් |
| ෆෙරස් ෆියුමරේට් (Ferrous fumarate) | 55 - 60 මිලි ග්‍රෑම්/කිලෝ ග්‍රෑම් |
| ෆෙරස් සල්ෆේට් (Ferrous sulphate) | 55 - 60 මිලි ග්‍රෑම්/කිලෝ ග්‍රෑම් |

EOG 01 - 0002

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.